# "සොබා චලන සිතුවම්" කෙටි චිත්‍රපට තරඟාවලිය 2024

2024 ජුනි 05 දිනට යෙදෙන ජගත් පරිසර දිනය නිමිත්තෙන් මෙම තරඟය සංවිධානය කර ඇත.

- **තේමාව** - පරිසරය පිළිබඳව ඕනෑම තේමාවක් ඔස්සේ නිර්මාණ ඉදිරිපත් කළ හැකිය.

## තරඟ කොන්දේසි

- **කාලය** - උපරිම විනාඩි 05කි.
- **තරඟ අංශ** - ප්‍රබන්ධ, වාර්තාමය සහ සජීවීකරණ
- **මාධ්‍ය** - සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂාවෙන් නිර්මාණ ඉදිරිපත් කල හැකි අතර සිංහල, දෙමළ යන භාෂාවෙන් සිදු කරන නිර්මාණ සඳහා ඉංග්‍රීසි භාෂාවෙන් උපසිරැසි යෙදිය යුතුය. (දෙබස් රහිත නම් මෙම කොන්දේසිය අදාළ නොවේ.)
- **තාක්ෂණික පිරිවිතර** -
  - රූගත කිරීම සඳහා සුදුසු ඕනෑම මෙවලමක් භාවිතා කළ හැකිය. (උදා: ජංගම දුරකතනයක් මඟින් රූගත කළ නිර්මාණයක් වුවද ඉදිරිපත් කළ හැකිය.)
  - එසේ වුවද අවසන් නිෂ්පාදනය පුළුල් තිරයකට ප්‍රක්ෂේපණය කිරීමට සුදුසු වන උසස් තීව්‍රතාවයකින් ( High Resolution) යුක්ත විය යුතුය.
- **නිර්මාණ ඉදිරිපත් කිරීම** -
  - එක් අයදුම්කරුවෙකුට නිර්මාණ එකකට වැඩි සංඛ්‍යාවක් ඉදිරිපත් කළ හැකිය.
  - එක් එක් නිර්මාණය වෙනුවෙන් වෙන් වූ දත්ත ගොනුවක් (Data file) ලෙස සංගත තැටියකින් (DVD) පිටපතක් ලෙස,

    හෝ
  - පහත විද්‍යුත් තැපැල් ලිපිනයට ද යොමු කළ හැකිය.

    sobachalana2024@gmail.com

- **බුද්ධිමය දේපල සම්බන්ධ කොන්දේසි** -
  - නිර්මාණයේ අන්තර්ගතය සම්බන්ධ සම්පූර්ණ වගකීම නිර්මාණකරු සතුවේ.
  - නිර්මාණය සඳහා කතෘ හිමිකම්වලින් නිදහස් (Royalty free) හෝ විවෘත අධ්‍යාපනික සම්පත් (Open Educational Resources) වශයෙන් පවත්නා සංගීතය හෝ ශබ්ද යොදා ගන්නේ නම් චිත්‍රපටය අවසානයේදී එසේ ලබාගත් මූලාශ්‍රයන් සඳහන් කළ යුතුය.

- **අවසන් හිමිකම**
    - මෙම තරඟයට ඉදිරිපත් කරන චිත්‍රපට සුදුසු අවස්ථාවන්හි ප්‍රදර්ශනය කිරීමේ සහ ප්‍රදර්ශනය සඳහා ආයතන වෙත ලබා දීමේ අයිතිය පරිසර අමාත්‍යාංශය සතු වේ.

- **වෙනත් කොන්දේසි**
    - නිර්මාණකරුවන් ඔවුන්ගේ සැබෑ නම යටතේ පමණක් චිත්‍රපට ඉදිරිපත් කළ යුතුය.
    - නිර්මාණයේ අයිතිය මුල් හිමිකරු සතුවිය යුතු අතර, ප්‍රකාශන හිමිකම් කඩ කිරීම නිර්මාණ ප්‍රතික්ෂේප කිරීමට හේතුවකි.
    - තරඟයේ විනිශ්චය කටයුතු අදාළ ක්ෂේත්‍රයේ ප්‍රවීණයන්ගෙන් සැදුම්ලත් විනිසුරු මඩුල්ලක් විසින් සිදු කරන අතර, විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.

- **ත්‍යාග** -

| | |
|---|---|
| 1 වෙනි ස්ථානය | - රු.50,000.00 |
| 2 වෙනි ස්ථානය | - රු.40,000.00 |
| 3 වෙනි ස්ථානය | - රු.30,000.00 |
| කුසලතා සම්මාන 05 | - රු.10,000.00 |

- පළමු, දෙවන සහ තෙවන ස්ථාන සඳහා මුදල් ත්‍යාගයට අමතරව සම්මානයක්ද, කුසලතා සම්මාන ජයග්‍රාහකයින්ට සමරු තිළිණයක් ද, ප්‍රදානය කෙරේ.
- සහභාගී වන සියලුම තරඟකරුවන් සඳහා වටිනා සහතික පත්‍රයක් ප්‍රදානය කෙරේ.
- නිර්මාණ භාර ගැනීමේ අවසන් දිනය - **2024. 07. 31**
- අයදුම් පත්‍ර සහ වැඩි විස්තර සඳහා -
    - වෙබ් අඩවිය www.env.gov.lk
    - ෆේස්බුක් පිටුවhttps://www.facebook.com/sobachalana.sithuwam
    - විද්‍යුත් තැපෑල - sobachalana2024@gmail.com
    - දුරකතන - 011-2034175